**කොණ්ඩඤ්ඤ රහතන් වහන්සේ අඤ්ඤාවීම**

බුදුන් වහන්සේ ඇසළ පොහෝ දිනක පළමු ධර්ම දේශනය පැවැත් වූ බවත් එහි දී පස්වග තවුසන්ගෙන් කෙනකු වූ කොණ්ඩඤ්ඤ තවුසන්ට (පසුව රහතන් වහන්සේට) ධර්මාවබෝධය වූ බවත් අපි දනිමු. එහෙත් කොණ්ඩඤ්ඤ රහතන් වහන්සේට අඤ්ඤා කොණ්ඩඤ්ඤ නමක් පටබැඳී ඇත්තේ ඇයි දැයි අපි නො දනිමු. අඤ්ඤා කොණ්ඩඤ්ඤ මහ රහතන් වහන්සේ අඤ්ඤා කොණ්ඩඤ්ඤ නමින් හඳුන්වනු ලැබුයේ කවදා සිට ද? උන්වහන්සේ බුදුන් වහන්සේගේ ශ්‍රාවකයන් වහන්සේ නමක වූ දා පටන් එසේ හැඳින්විණි ද? උන්වහන්සේ පස්වග තවුසන් නමින් හැඳින්වුණු කණ්ඩායමේ සාමාජිකයකු ව සිටි අවධියේ ද එලෙස හඳුන්වනු ලැබිණි ද? එසේත් නැත්නම් උන්වහන්සේට අඤ්ඤා නම ලැබුණේ දෙමව්පියන් ගෙන් ද? මේ ප්‍රශ්නවලට එක එල්ලේ ලබාදෙන පිළිතුරක් පැරණි සාහිත්‍යයෙන් සොයාගැනීම දුෂ්කර වෙයි. ඇතැමුන්ට සමහරවිට මෙහි ප්‍රශ්නයක් දැකීමටවත් නො හැකිවනු ඇත. ඔවුන්ට සිතෙනු ඇත්තේ අඤ්ඤා කීවත් නැතත් කොණ්ඩඤ්ඤ මහා රහතන් වහන්සේ පස්වග මහණුන්ගෙන් ජ්‍යෙෂ්ඨතමයා බව ය. පළමුවෙන්ම බුදුන්වහන්සේගේ ධර්මය අවබෝධකරගෙන මාර්ගඵල ලැබුයේ උන්වහන්සේ ය.

අඤ්ඤා යන්නෙන් නොදැනීම ප්‍රකාශ වෙයි. එහි වෙනත් අර්ථ ද තිබෙනු හැකි ය. එහෙත් මෙහි අඤ්ඤා යන්න යෙදෙන්නේ කොණ්ඩඤ්ඤ යන්න සමග ය. කොණ්ඩඤ්ඤ යන්නෙහි තේරුම වැඩිම දැනුමක් (ඤාණයක්) ඇත්තා ලෙස ගතහැකි යැයි සිතමි. ඒ කොණ්ඩ යන්න මුදුන, ශිඛරය යන තේරුමින් ගැනීමෙන් ය. ඇතැම්විට පස්වග තවුසන් අතර පමණක් නොව එකල විසූ බොහෝ අය අතර ඤාණයෙන් වැඩිම තැනැත්තා වූයේ කොණ්ඩඤ්ඤ තවුසාණන් විය හැකි ය.

බෞද්ධ සාහිත්‍යයෙහි සඳහන් අන්දමට බුදුන් වහන්සේ බුදු වීමෙන් පසුව තමන්වහන්සේගේ ධර්මය අන් අයට අවබෝධකරගැනීමට අපහසු බැවින් දහම් නොදෙසීමට කල්පනාකරමින් සිටින අතර සහම්පතී මහා බ්‍රහ්මයා පැමිණ දහම් දෙසන ලෙස ආරාධනා කර ඇත. එවිට බුදුන් වහන්සේ දහම අවබෝධකරගැනීමට හැකි අය කවරේදැයි සිතූ බවත් උන්වහන්සේට ආළාර කාළාම හා උද්දකාරාමපුත්ත තිස්ස යන තවුසන් මතක් වූ බවත් කියැවෙයි. එහෙත් ඒ අය එවන විට අභාවප්‍රාප්ත ව සිටි බැවින් බුදුන් වහන්සේ ඉන්පසුව තීරණය කෙළේ පස්වග මහණුන්ට දහම් දෙසීමට යැයි සාහිත්‍යයෙහි තවදුරටත් සඳහන්වෙයි.

මේ කතාව ඒ ආකාරයෙන් ම සිදුවිණි ද නැත් ද යන්න කෙසේ වුව ද ඉන් කියැවෙන කරුණු බොහෝමයක් වෙයි. පළමුවෙන් ම බුදුන් වහන්සේගේ ධර්මය අවබෝධකරගැනීමට ඇති අපහසුතාව වෙයි. දෙවනුව ඒ දහම තේරුම්ගැනීමේ හැකියාව ඇති එකල සිටි පුද්ගලයන් අතර අඩුම තරමින් තුන්වැනි තැන කොණ්ඩඤ්ඤ තවුසාණන්ට හිමි වෙයි. සිදුහත් කුමරු සිදුහත් තවුසාණන් බවට පත්වීමෙන් පසුව විමුක්තිය සොයා යෑමේ දී ගුරුවරුන් හෝ මිතුරන් හෝ ලෙස ඇසුරු කෙළේ ද ඉහත නම් සඳහන් තවුසන් බව අමතක නොකළ යුතු ය. ඒ අය එකල විසූ දැනුමෙන් හා බුද්ධියෙන් උසස් ම පුද්ගලයන් වන්නට ඇතැයි අපට සිතාගත හැකි ය. සිදුහත් කුමරු ගිහිගෙහි වාසයකරන කාලයෙහි ඇසුරු කළ අසිත තවුසාණන් ද අග්‍රගණ්‍ය බුද්ධිමතකු වූවාට සැකයක් නැත. එහෙත් අසිත තවුසාණන් තමන් කලින් ම දැනසිටි ආකාරයට බුදුන් වහන්සේ බුද්ධත්වයට පැමිණීමට පෙර ම මියගොස් තිබිණි.

මහත් වූ දැනුමක් තිබූ කොණ්ඩඤ්ඤ තවුසා බුදුන් වහන්සේගේ ධර්මය අවබෝධකිරීමෙන් පසුව අඤ්ඤා තත්ත්වයට පත්වූ ප්‍රථමයා යැයි සිතිය හැකි ය. බුදුන් වහන්සේගේ ධර්මය අවබෝධකරගෙන මාර්ග ඵල ලැබ රහතන් වහන්සේලා බවට පත්වන්නන් සියල්ලන් ම අඤ්ඤා තත්ත්වයට පත්වන නමුත් එසේ වූ පළමු රහතන් වහන්සේ කොණ්ඩඤ්ඤ රහතන් වහන්සේ බැවින් උන්වහන්සේට පමණක් අඤ්ඤා යන්න යෙදිණි යැයි සිතිය හැකි ය. මෙයින් ගම්‍යවන්නේ අඤ්ඤා කොණ්ඩඤ්ඤ රහතන් වහන්සේට අඤ්ඤා යන්න එකතුවූයේ බුදුන් වහන්සේගේ ධර්මය අවබෝධවීමෙන් පසුව මිස ඉන් පෙර නොවන බව ය. මෙහි දී තවත් දෙයක් පැහැදිලි කළ යුතු ය. එනම් බුදුන් වහන්සේගේ ධර්මය අවබෝධවීමෙන් අඤ්ඤා තත්ත්වයට පත්වන්නේ කෙසේ ද යන්න ය.

© Prof. Nalin De Silva

බුදුන් වහන්සේගේ ධර්මය අනෙක් දැනුම්වලින් වෙනස්වන්නේ ඇයි? අනෙක් දැනුම් සියල්ල, බටහිර විද්‍යාව, මෙරට විද්‍යාව, කලා ශිල්ප ආදී සියල්ල ලෝකයේ ඇති නොයෙකුත් දෑ තේරුම්ගැනීම සඳහා වෙයි. මෙහි දී ලෝකයේ ඇති සියල්ල යනුවෙන් යෙදුණ ද එය ව්‍යවහාර අර්ථයෙන් පමණක් යෙදෙන්නකි. ලෝකය මෙන් ම එහි ඇතැයි කියන දේ ද නිර්මානය කෙරෙන්නේ සවිඥානික සත්ත්වයන් විසින් ය. ලෝකයක් ඇතැයි අපි ගනිමු. එනම් අපි එවැනි ලෝකයක් නිර්මානය කරන්නෙමු. ඉන්පසු අපි ඒ  ලෝකය තේරුම්ගැනීමට විවිධ සංකල්ප, ප්‍රවාද ආදිය නිර්මානය කරන්නෙමු. දැනුම යනු මේ සංකල්ප හා ප්‍රවාද ආදියෙහි සමුච්චය වෙයි.

මම යනු මේ දැනුමෙහි එක් කොටසක්, එහෙත් වැදගත් ම කොටස වෙයි. මම යන්න ද අපේ ම නිර්මානයකි. මම ද ඇතුළු සියළු දැනුම් සංස්කාර වෙයි. ඒ සියළු සංස්කාර අනිත්‍ය දුක්ඛ අනාත්ම වෙයි. සංස්කාර යනු අවිද්‍යාවේ ප්‍රතිඵල වෙයි. අවිද්‍යාව යනු අනිත්‍ය, දුක්ඛ අනාත්ම අනාවබෝධයයි. මේ සියල්ල එකක් අනෙකට සම්බන්ධ වෙයි. පටිච්ච සමුප්පදායෙහි කෙරෙන්නේ ඒ එකක් නිසා අනෙක ඇතිවන ක්‍රියාවලිය (ක්‍රියාවලිය යැයි කීව ද ඒ එකට උපදින ක්‍රියාවකි)  තේරුම්කර දීම ය. නිවන් අවබෝධවන්නේ මේ ක්‍රියාවලිය නැවතීමෙන් ය. ඒ ක්‍රියාවලිය නැවතීම යනු මම ද නැතිකිරීම ය. එනම් මම යනුවෙන් කිසිවකු නැති බව, මනසක් යනුවෙන් කිසිවක් නැති බව, අවබෝධකරගැනීම ය. එහෙත් අප ඒ අවබෝධය ලබාගන්නේ කෙසේ ද? ඒ අවබෝධය යනු අන්කිසිවක් නොව අනිත්‍ය දුක්ඛ අනාත්ම අවබෝධය ය. ප්‍රශ්නය වනුයේ ද ඒ අවබෝධය ලබාගන්නේ කෙසේ ද යන්න ය.

අප සාමාන්‍යයෙන් යමක් අවබෝධකරගන්නේ සංකල්ප හා ප්‍රවාද  ඇසුරෙන් ය. ඒ දැනුම ය. එහෙත් අනිත්‍ය, දුක්ඛ, අනාත්ම යනු සංකල්ප නො වෙයි. නිවන අවබෝධකරගැනීම අපහසුවන්නේ මේ කරුණ නිසා ය. සාමාන්‍ය අවබෝධය හා නිවන් අවබෝධය යනු එකම ආකාරයේ අවබෝධකරගැනීම් නො වෙයි. අවබෝධය යන එකම වචනය යොදාගත්ත ද ඒ දෙකකි. එලෙස ඒ දෙකක් යනුවෙන් හැඳින්වීම පවා නිවැරදි නො වෙයි. සාමාන්‍ය අවබෝධය, අවබෝධයක් ලෙස එකක් යනුවෙන් ගතහැකි වුව ද නිවන් අවබෝධය එකක් ලෙස පවාගත නොහැකි ය. සාමාන්‍ය අවබෝධයෙහි දී අපි සංකල්ප හා ප්‍රවාද යොදාගන්නෙමු. එහි දී මනස ආධාරකර ගන්නෙමු. එහෙත් නිවන් අවබෝධය එලෙස සංකල්ප මගින් නොකළ හැකිවෙයි. මනසක් නැති බව මනසින් අවබෝධකරගන්නේ කෙසේ ද? නැති මනස නැති මනසක් බව අවබෝධකරගන්නේ කෙසේ ද? සාමාන්‍ය අවබෝධයෙන් අපට ලැබෙන්නේ දැනුමකි. ඒ සංස්කාර හෙවත් අප විසින් නිර්මානය කෙරෙන්නෙකි. එහෙත් නිවන එසේ නො වෙයි. නිවන යනුවෙන් නාම පදයක් යොදා ගත්ත ද නිවන යනු ඇති තැනක් හෝ සංකල්පයක් හෝ නො වෙයි. අපට කතාකිරීමෙහි දී වචන අවශ්‍ය නිසා නිවන යනුවෙන් වචනයක් තිබිණ ද ඒ සංකල්පයක්, දැනුමක් ලෙස නො ගතහැකි ය.

නිවන් අවබෝධය අනෙක් අවබෝධ මෙන් සංකල්ප නිර්මානයකිරීමෙන් කළ හැකි වූවක් නො වෙයි. මම ද ඇතුළු සියළු දැනුම් නිවන් අවබෝධයෙහි දී නො දැනුම් බවට පත්වෙයි. ඒ ඊනියා පශ්චාත්නූතනවාදයෙහි දක්නට ලැබෙන විසංයෝජනය නො වෙයි. විසංයෝජනය යනු ද දැනුමක් වෙයි. නිවන් අවබෝධවන්නේ විසංයෝජනයෙන් නොව විසංකාරයෙන් ය. විසංයෝජනය හා විසංකාරය යනු එකක් නො වෙයි. හිටපු කතෝලික පූජකවරයකු  විසංකාර හා විසංයෝජන යනු එකක් යැයි පවසන්නේ බුදු දහමට සේවයක් කිරීමට විය නො හැකි ය. අනෙක් අතට නිවන් අවබෝධය යනු ඊනියා යථයක් අවබෝධකරගැනීමක් ද නො වෙයි. යථය ද වචනයෙන් විස්තර නොවුණ ද දැනුමකි. යථාර්ථය (රියැලිටි) යන්න වචනයෙන් ප්‍රකාශකෙරෙන නිසා ඒ සාපේක්ෂ බව තේරුම්ගත් බටහිරයන්ට නිරපේක්ෂයක් අවශ්‍ය විය. එහි ප්‍රතිඵලයක් ලෙස යථය (රියල්) සංකල්ප ගතකෙරිණි. ඊනියා යථයක් ගැන කතාකරන දෙදෙනකුගේ යථ(ය) එකක් ම දැයි මෙරට සිටින පුහු අනුකාරකයන්ට තබා ඔවුන්ගේ බටහිර ස්වාමීන්ටවත් කිවහැකි ද?

කොණ්ඩඤ්ඤ තවුසාණන් අඤ්ඤා කොණ්ඩඤ්ඤ රහතන් වහන්සේ බවට පත්වන්නේ දන්නා තත්ත්වයෙන් නොදන්නා තත්ත්වයට පත්වීමෙන් ය. බුදුන් වහන්සේට පසුව ඒ තත්ත්වයට පත්වීමේ මගට පිවිසි පළමු තැනැත්තා වූයේ අඤ්ඤා කොණ්ඩඤ්ඤ රහතන් වහන්සේ ය. අනෙක් රහතන් වහන්සේ ද අඤ්ඤා වන නමුත් කලින් සඳහන්කර ඇති පරිදි කොණ්ඩඤ්ඤ රහතන් වහන්සේට පමනක් අඤ්ඤා යන්න යෙදෙන්නේ උන්වහන්සේ බුදුන් වහන්සේට  පසු මාර්ගඵල ලැබ නොදන්නා තත්ත්වයට පත්වීමේ මගට පිවිසි පලමුවැන්නා නිසා විය හැකි ය. (පාණදුරේ වැකඩ බෞද්ධ සහෝදර සමිතිය මගින් පළකෙරෙන වෙසක් හඬ සඟරාවේ අනුග්‍රහයෙනි.)

© Prof. Nalin De Silva